संस्कृतपाठमाला । ३

සංස්කෘතපාඨමාලා 3

वन्दना

शुभं करोति कल्याणमारोग्यं धनसंपदा ।
शत्रुबुद्धिविनाशाय दीपज्योतिर्नमोऽस्तुते ॥

ध्यानमूलं गुरोर्मूर्तिः पूजामूलं गुरोः पदम् ।
मन्त्रमूलं गुरोर्वाक्यं मोक्षमूलं गुरोः कृपा ॥

काले वर्षन्तु पर्जन्यः पृथिवी शस्यशालिनी ।
देशोयं क्षोभरहिताः सर्वे सन्तु निर्भयः ॥

දුරවබෝධ පද

कल्याणमारोग्यं - [कल्याणं+आरोग्यं] යහපත හා නිරෝගිබව

धनसंपदा - ධනසම්පත්තිය

दीपज्योतिर्नमोऽस्तुते-[दीपज्योतिः+नमः+अस्तु+ते]

ध्यानमूलं - ධ්‍යාන මුල්කොටගෙන

गुरोर्मूर्तिः - ගුරුවරයාගේ රුව

पूजामूलं - පූජා ව මල්කොටගෙන

पदम् - පියවර

मन्त्रमूलं - මන්ත්‍ර මුල්කොටගෙන

पर्जन्यः - වළාකුළු

शस्यशालिनी- ශස්‍යඇත්තේ

क्षोभरहिताः - කැළඹීම් රහිත වෙත්වා.

प्रथमः पाठः।

विद्या ददाति विनयम्।

श्रुतो हितोपदेशोऽयं पाटवं संस्कृतोक्तिषु।
वाचां सर्वत्र वैचित्र्यं नीतिविद्यां ददाति च ॥१॥

अजरामरवत् प्राज्ञो विद्यामर्थं च चिन्तयेत्।
गृहीत इव केशेषु मृत्युना धर्ममाचरेत् ॥२॥

सर्वद्रव्येषु विद्यैव द्रव्यमाहुरनुत्तमम्।
अहार्यत्वादनर्घत्वादक्षयत्वाच्च सर्वदा ॥३॥

विद्या ददाति विनयं विनयाद्याति पात्रताम्।
पात्रत्वाद्धनमाप्नोति धनाद्धर्मं ततः सुखम् ॥४॥

विद्या शस्त्रस्य शास्त्रस्य द्वे विद्ये प्रतिपत्तये।
आद्या हास्याय वृद्धत्वे द्वितीयाद्रियते सदा ॥५॥

අර්ථ පරිවර්තනය

०१ श्रुतः+हितोपदेशः+अयम् (श्रुतः अयम् हितोपदेशः)
උගත්තා වූ [ශ්‍රවණය කළ] මේ හිතෝපදේශය,
पाटवं संस्कृत+उक्तिषु (संस्कृत उक्तिषु पाटवं)
සංස්කෘත ප්‍රකාශයන්හි නිපුණත්වය ද
वाचां सर्वत्र वैचित्र्यं (सर्वत्र वाचां वैचित्र्यं)
සියලු තන්හි වචනයන්ගේ විචිත්‍රභාවය ද
नीतिविद्यां ददाति च (नीतिविद्यां च ददाति)
[අර්ථශාස්ත්‍ර, ධර්මශාස්ත්‍ර හා රාජනීති යන] නීති පිළිබඳ දැනීම ද ලබා දෙයි.

०२. अजर+अमरवत् प्राज्ञः   (प्राज्ञः अजर अमरवत्)
නුවණැත්තා ජරා හා මරණ ස්වභාව නැත්තෙකු මෙන්
विद्याम्+अर्थं च चिन्तयेत्
දැනුම හා ධනය ගැන සිතිය යුතු ය.
गृहीत+इव केशेषु मृत्युना (मृत्युना केशेषु गृहीत इव)
මාරයා විසින් කෙස්වලින් අල්ලාගත්තකු මෙන්
धर्मम्+आचरेत्
ධර්මයෙහි හැසිරිය යුතු ය.

०३ **सर्वद्रव्येषु विद्या+एव**

සියලු ද්‍රව්‍යයන් අතරින් දැනුම ම

द्रव्यम्+आहुः+अनुत्तमम् (**अनुत्तमं द्रव्यम् आहुः**)

ඉතා උතුම් ද්‍රව්‍යය යැයි [විද්වත්හු] කීහ.

सर्वदा अहार्यत्वात्

හැම කල්හි [සොර සතුරු ආදීන් විසින්] පැහැරගත නොහැකි බැවින්,

अनर्घत्वात्

[වටිනාකම මෙතෙකැයි] මිළ කළ නොහැකි බැවින්, [හා]

अक्षयत्वात् च

[පරිත්‍යාගාදියෙන් කිසිවිට] ක්ෂය නොවන ද බැවිනි.

४ **विद्या ददाति विनयं (विद्या विनयं ददाति)**

ශාස්ත්‍ර ඥානය [තුළින්] හික්මීම ලබා දෙයි. [ලැබෙයි.]

विनयात्+याति पात्रताम् (विनयात् पात्रताम् याति)

හික්මීමෙන් [සම්පත් හා ගෞරවයට] පාත්‍රවෙයි [බඳුන් වෙයි.]

पात्रत्वात्+धनम्+आप्नोति

[ගෞරවයට] බඳුන් වීමෙන් ධනය ලැබෙයි.

धनात्+धर्मं ततः सुखम्

ධනයෙන් දහම [ද] එයින් පසුව [දෙලොව] සැපයට ද [පැමිණෙයි.]

५ **विद्या शस्त्रं च शास्त्रं च**

[දුනු ශිල්ප, කඩු ශිල්ප ආදි] ආයුධ [පිළිබඳ] දැනුම ද, [තර්ක, ව්‍යාකරණාදි] ශාස්ත්‍රීය දැනුම ද [වශයෙන්]

द्वे विद्ये प्रतिपत्तये

දැනුම් වර්ග දෙකක් දක්නට ලැබේ.

आद्या हास्याय वृद्धत्वे (आद्या वृद्धत्वे हास्याय)

මුලින් කී [ආයුධ පිළිබඳ දැනුම] මහලු කල්හි සිනහව පිණිස පවතී.

द्वितीया+अद्रियते सदा (द्वितीया सदा अद्रियते) දෙවනුව කී ශාස්ත්‍රීය දැනුම [ලෝ වැස්සන් විසින්] හැම කල්හි අගය කරනු ලැබේ.

<u>දුරවබෝධ පද හා ව්‍යාකරණ විස්තර</u>

पाठवं –उक्ति ප්‍රකාශ/කියමන් (**कथनं/व्यवहारः/लपितं/भाषितं/वचनं/वचः**) **नीतिविद्यां** – රාජ නීති, ධර්ම නීත්‍යාදි ශාස්ත්‍ර **अनुत्तमम्** – ඉතා ශ්‍රේෂ්ඨ

<u>ව්‍යාකරණ විස්තර හා ශබ්ද නිර්වචන</u>

ච

द्वितीयः पाठः ।

सर्वस्य लोचनं शास्त्रम् ।

अनेकसंशयोच्छेदि परोक्षार्थस्य दर्शकम् ।
सर्वस्य लोचनं शास्त्रं यस्य नास्त्यन्ध एव सः ॥१॥

यौवनं धनसंपत्तिः प्रभुत्वमविवेकिता ।
एकैकमप्यनर्थाय, किमु यत्र चतुष्टयम् ॥२॥

कोऽर्थः पुत्रेण जातेन यो न विद्वान्न धार्मिकः ।
काणेन चक्षुषा किं वा, चक्षुः पीडैव केवलम् ॥३॥

अजातमृतमूर्खाणां वरमाद्यौ न चान्तिमः ।
सकृद्दुःखकरावाद्यावन्तिमस्तु पदे पदे ॥४॥

गुणिगणगणनारम्भे न पतति कठिनी ससंभ्रमाद्यस्ययस्य ।
तेनम्बा यदि सुतिनी वद वन्ध्या कीदृशी भवति ॥५॥

<u>අර්ථ පරිවර්තනය</u>

१ **अनेक संशय+उच्छेदि**
නොයෙක් සැක සිඳදමන
परोक्ष+अर्थस्य दर्शकम्
ඉඳුරන්ට විෂය නොවූ අරමුණු පවා පෙන්වන
सर्वस्य लोचनं शास्त्रं
සියල්ලට ඇසක් බඳු වූ දැනුම
यस्य नास्ति+अन्ध एव सः (यस्य नास्ति सः अन्धः एव)
නැති තැනැත්තා අන්ධයෙක්ම ය.

२ **यौवनं धनसंपत्तिः**
තරුණකම හා ධන සම්පන්න භාවය ද
प्रभुत्वम्+अविवेकिता
නායකත්වය හා නොවිමසා කටයුතු කිරීම [යන කරුණු හතර]
एक+एकम्+अपि+अनर्थाय
එක එකක් පාසා අනර්ථය පිණිස ම පවතී.
किमु यत्र चतुष्टयम्? (यत्र चतुष्टयम् किमु?)
හතර ම ඇති තැන කවර කථා ද?

३ यः न विद्वान् न धार्मिकः

යමෙක් නූගත් හා අධාර්මික වේ ද

कः+अर्थः पुत्रेण जातेन? (जातेन पुत्रेण कः अर्थः)

උපන්නා වූ [එම]දරුවාගෙන් කවර ප්‍රයෝජනයක් ද?

काणेन चक्षुषा किं? (काणेन चक्षुषा किं?)

අන්ධ වූ ඇසින් කවර ප්‍රයෝජනයක් ද?

चक्षुः पीडा+एव केवलम् (केवलम् चक्षुः पीडा एव)

[හුදෙක්] ඇසට පීඩාවක් ම පමණි.

४ अजात मृत मूर्खेभ्यः

නූපන්, මළ [සහ] මෝඩ [යන තුන් වැදෑරුම්] පුත්‍රයන් අතුරෙන්

वरम्+आद्यौ न च+अन्तिमः (आद्यौ वरं न च अन्तिमः) මුලින් කී දෙදෙනා උතුම් වේ. අන්තිමයා උතුම් නොවේ.

सकृत्+दुःखकरौ+आद्यौ (आद्यौ सकृत् दुःखकरौ)

මුලින් කී දෙදෙන එක්වරක් පමණක් දුක් ඇතිකරවයි.

अन्तिमः+तु पदे पदे

අන්තිමයා වනාහි පියවරක් පියවරක් පාසා [දුක් ඇති කරවයි.]

५ गुणिगण गणन+आरम्भे

ගුණැති මිනිසුන්ගේ නම් ගණන් කිරීමට පටන් ගත් කල්හි

न पतति कठिनी ससंभ्रमा यस्य (यस्य ससंभ्रमा कठिनी न पतति)

යමෙකුගේ [නම ඉදිරියෙන්] වහා පන්හිඳ හෙවත් පෑන නොවැටෙන්නේ ද?

तेन+अम्बा यदि सुतिनी

ඒ පුත්‍රයා කරණකොටගෙන මව ඉදින් දරුවන් සිටින තැනැත්තියක වී නම්,

वद वन्ध्या कीदृशी भवति (वन्ध्या कीदृशी भवति वद)

වඳ තැනැත්තිය කෙබඳු වේ දැයි කියන්න.

<u>දුරවබෝධ පද</u>

कान अन्ध (නිර්වචන කල්පද්‍රැම)**परोक्षार्थ** - ඇසට ගොදුරු නොවූ අරමුණු **लोचनं** - ඇස **अविवेकिता** - විවේක රහිත බව **सकृत्** - වරක් **कठिनी** - පෑන **ससंभ्रमा** - වහා, ඉක්මනින් **अम्बा** මව (යත්‍ර චතුෂ්ටයම්) හතර ම ඇති තැන (ප්‍රයෝග) යඝ්‍ය නාස්ත්‍යන්ධ ඒව

<u>ව්‍යාකරණ විස්තර හා ශබ්ද නිර්වචන</u>

तृतीयः पाठः

अकस्मादागन्तुना सह मैत्री न युक्ता।

अस्ति मगधदेशे चम्पकवती नामारण्यानी। तस्यां चिरान्महता स्नेहेन मृगकाकौ निवसतः। स च मृगः स्वेच्छया भ्राम्यन् हृष्टपुष्टाङ्गः केनचिच्छृगालेनावलोकितः। तं दृष्ट्वा शृगालोऽचिन्तयत् - आः कथमेतन्मांसं सुललितं भक्षयामि। भवतु विश्वासं तावदुत्पादयामि। इत्यालोच्योपसृत्याब्रवीत्- मित्र कुशलं ते मृगेणोक्तम् कस्त्वम् स ब्रूते- क्षुद्रबुद्धिनामा जम्बूकोऽहम्। अत्रारण्ये बन्धुहीनो मृतवदेकाकी वसामि। इदानीं त्वां मित्रमासाद्य पुनः सबन्धुर्जीवलोकं प्रविष्टोऽस्मि। अधुना तवानुचरेण मया सर्वथा भवितव्यम्। मृगेणोक्तम्- एवमस्तु। ततः पश्चादस्तंगते सवितरि भगवति मरीचिमालिनि तौ मृगस्य वासभूमिं गतौ। तत्र चम्पकवृक्षशाखायां सुबुद्धिनामा काको मृगस्य चिरमित्रं निवसति। तौ दृष्ट्वा काकोऽवदत्। सखे चित्राङ्ग कोऽयं द्वितीयः। मृगो ब्रूते - जम्बुकोऽयम्। अस्मत्सख्यमिच्छन्नागतः। काको ब्रूते- मित्र अकस्मादागन्तुना सह मैत्री न युक्ता।

अकस्मादागन्तुना सह मैत्री न युक्ता।

අහම්බෙන් ආගන්තුක ව පැමිණි අය හා මිත්‍රභාවය සුදුසු නැත.

नाम+अरण्यानी (मगधदेशे चम्पकवती नाम अरण्यानी अस्ति)

මගධ රටෙහි චම්පකවතී නම් කැලයක් ඇත.

चिरात्+महता (तस्यां चिरात् महता स्नेहेन मृगकाकौ निवसतः)

එහි බොහෝ කලක පටන් මහත් වූ සෙනෙහසකින් මුවෙක් හා කවුඩෙක් වාසය කරත්.

स्व+इच्छया / हृष्टपुष्ट+अङ्गः / केनचित्+श्रुगालेन+अवलोकितः (स मृगः च स्वेच्छया भ्राम्यन् हृष्टपुष्ट अङ्गः केनचित् श्रुगालेन अवलोकितः)

ඒ මුවා ද තම අභිමතය පරිදි [කැලයෙහි] හැසිරෙන්නේ ලෙලදෙන මහත් ව ගිය සිරුර ඇත්තේ කිසියම් සිවලෙකු විසින් දක්නා ලදී.

शृगालः+अचिन्तयत् (तं दृष्ट्वा शृगालः अचिन्तयत्)

ඌ දැක සිවලා මෙසේ සිතුවේ ය.

कथम्+एतत्+मांसं (आः सुललितं एतत् मांसं कथम् भक्षयामि)

ඕ...හෝ ඉතා ලෙලදෙන [මොළොක් වූ] මේ මාංශය කෙසේ [නම්] අනුභව කරම් ද?

तावत्+उत्पादयामि (भवतु तावत् विश्वासं उत्पादयामि)

හොඳයි, පළමුකොට [මොහු සමඟ] විශ්වාසය ගොඩනඟා ගනිමි.

इति+आलोच्य+उपसृत्य+अब्रवीत् (इति आलोच्य उपसृत्य अब्रवीत्)

මෙසේ සලකා සමීපයට එළෙඹ කීවේ ය.

मृगेण+उक्तम् /कः+त्वम् (मित्र कुशलं ते, मृगेण उक्तम् कः त्वम् ?)

යහළුවෙ කොහොමද? සැප සනීප, මුවා විසින් කියන ලදී. නුඹ කවිද?

जम्बूकः+अहम् (स ब्रूते- अहम् क्षुद्रबुद्धिनामा जम्बूकः)

මම ක්‍ෂුද්‍රබුද්ධි නම් වූ සිවලෙක්මි.

अत्र+अरण्ये / मृतवत्+एकाकी (अत्र अरण्ये बन्धुहीनो मृतवत् एकाकी वसामि)

මේ කැලයෙහි නෑයන්ගෙන් තොර වූයේ මළ එකකු සේ හුදෙකලාව වාසය කරමි.

मित्रम्+आसाद्य / सबन्धुः+जीवलोकं / प्रविष्टः+अस्मि (इदानीं मित्रम् त्वां आसाद्य पुनः सबन्धुः जीवलोकं प्रविष्टः अस्मि)

දැන් මිතුරකු වූ නුඹ ලැබ නැවතත් නෑයන් ඇත්තෙකු වූයේ දිවිගෙවීමට ජීවිතයට පිවිසියේ වෙමි.

तव+अनुचरेण (अधुना सर्वथा तव अनुचरेण मया भवितव्यम्)

දැන් සියලු ආකාරයෙන් ම නුඹ අනුව හැසිරෙන්නා වූ ම විසින් මෙසේ විය යුතුය.

मृगेण+उक्तम् / एवम्+अस्तु (मृगेण उक्तम् एवम् अस्तु)

මුවා විසින් කියන ලදී. එසේ වේවා.

पश्चात्+अस्तंगते (ततः पश्चात् मरीचिमालिनि भगवति सवितरि अस्तंगते तौ मृगस्य वासभूमिं गतौ) එයින් පසුව රැස්මාලා ඇති භාග්‍යවත් වූ සූර්‍ය්‍යයා අස්තයට පැමිණි කල්හි ඔවුහු දෙදෙන මුවාගේ නිවාසස්ථානයට ගියහ.

तत्र चम्पकवृक्षशाखायां मृगस्य चिरमित्रं सुबुद्धिनामा काकः निवसति

එහි සපුගසක අත්තක මුවාගේ බොහෝ කලක පටන් මිත්‍රයකු වූ සුබුද්ධි නම් කවුඩෙක් වාසය කරයි.

काकः+अवदत् (तौ दृष्ट्वा काकः अवदत्)

ඔවුන් දෙදෙන දැක කපුටා කීවේ ය.

कः+अयं (सखे चित्राङ्ग, अयं द्वितीयः कः)

මිත්‍ර චිත්‍රාංගය, මේ දෙවැනියා කවරෙක් ද?

जम्बुकः+अयम् (मृगः ब्रूते - जम्बुकः अयम्)

මුවා කියයි. මූ [මේ] නරියෙක්.

अस्मत्सख्यम्+इच्छन्+आगतः (अस्मत्सख्यम्+इच्छन्+आगतः)

අප සමඟ මිත්‍රභාවයට කැමති ව පැමිණියේ ය.

अकस्मात्+आगन्तुना (काकः ब्रूते- मित्र, अकस्मात् आगन्तुना सह मैत्री न युक्ता)

කපුටා කියයි. යහළුවේ, අහම්බෙන් ආගන්තුක ව පැමිණි අය සමඟ මිත්‍රභාවය සුදුසු නැත.

<u>ව්‍යාකරණ විස්තර හා ශබ්ද නිර්වචන</u>

स्वेच्छया - ස්වාභිමත පරිදි **हृष्टपुष्टाङ्गः** - රෝමවලින් යුක්ත වූ පෘෂ්ඨිමත් ශරීරාවයව ඇති **सुललितं** - ඉතා ලෙලදෙන **उत्पादयामि** - උපදවමි. **आलोच्य** - සලකා, කල්පනා කොට **उपसृत्य** - එළෙඹ **आसाद्य** - ලැබ **तवानुचरेण** - නුඹට අනුව හැසිරීමෙන් **सर्वथा** - සියලු ආකාරයෙන් **अस्तंगते** -

අස්තයට ගිය කල්හි **सवितरि** - සූර්යයා **भगवति** - භගවත් වූ **मरीचिमालिनि** - රශ්මාලා සහිත වූ **चिरमित्रं** - බොහෝ කලක පටන් මිතුරු වූ

अस्मत्सख्यमिच्छन् - අප හා මිත්‍ර බව කැමතිව **अकस्मात्** - අහම්බෙන්

चतुर्थः पाठः

वरमेको गुणी पुत्रो ।

दाने तपसि शौर्ये च यस्य न प्रथितं मनः ।
विद्यायामर्थलाभे च मातुरुच्चार एव सः ॥१॥

वरमेको गुणी पुत्रो न च मूर्खशतान्यपि ।
एकश्चन्द्रस्तमो हन्ति न च तारागणा अपि ॥२॥

अर्थागमो नित्यमरोगिता च प्रिया च भार्या प्रियवादिनी च ।
वश्यश्च पुत्रोऽर्थकरी च विद्या षड् जीवलोकस्य सुखानि राजन् ॥३॥

ऋणकर्ता पिता शत्रुर्माता च व्यभिचारिणी ।
भार्या रूपवती शत्रुः पुत्रः शत्रुरपण्डिता ॥४॥

अनभ्यासे विषं विद्या अजीर्णे भोजनं विषम् ।
विषं सभा दरिद्रस्य वृद्धस्य तरूणी विषम् ॥५॥

<u>අර්ථ පරිවර්තනය</u>

१ **दाने तपसि शौर्ये च**
දීමෙහි ද, තපසෙහි ද, ශූරභාවයෙහි ද
विद्यायाम्+अर्थलाभे च
ශාස්ත්‍රාදිය උගැන්මෙහි ද, ධන ලාභයෙහි ද
यस्य मनः न प्रथितं
යමෙකුගේ සිත නොයෙදෙයි ද
मातुः+उच्चार एव सः (सः मातुः उच्चार एव)
ඒ පුත්‍රයා මවගේ අශුචි හා සම වේ.

२ वरम्+एकः गुणी पुत्रः (एकः गुणी पुत्रः वरम्)

එක [ම] ගුණවත් පුත්‍රයා උතම් ය.

मूर्खशतानि+अपि न च

මෝඩ පුත්‍රයන් සියයක් වුවත් උතුම් නොවේ.

एकः+चन्द्रः+तमः हनित

එක ම සඳක් අඳුර නසයි.

तारागणा अपि न च

තරු රැසකින් වුවත් එසේ නොවේ.

३ अर्थाः+आगमः नित्यम् +अरोगिता च (नित्यम् अर्थाः आगमः अरोगिता च)

නිතර ධනය ලැබීම ද, නීරෝගි භාවය ද

प्रियः+च भार्या प्रियवादिनी च (भार्या प्रियः च प्रियवादिनी च)

බිරිඳ සතුට ගෙන දෙන්නී ද, ප්‍රිය වදන් තෙපලන්නී ද

वश्यः+च पुत्रः+अर्थकरी च विद्या (पुत्रः वश्यः च विद्या अर्थकरी च)

පුත්‍රයා කීකරු වූයේ ද, ඉගෙන ගත් ශාස්ත්‍රය වස්තුව ඇතිකරන්නී ද [යන]

षड् जीवलोकस्य सुखानि राजन् (राजन् षड् जीवलोकस्य सुखानि)

රජතුමනි! [මේ] හය ජීවලෝකයාගේ සැපයෝ වෙති.

४ ऋणकर्ता पिता शत्रुः

ණයකාර පියා සතුරෙකි.

माता च व्यभिचारिणी (व्यभिचारिणी माता च)

පර පුරුෂයන් කරා යන මව ද (සැතිරියකි.)

भार्या रूपवती शत्रुः (रूपवती भार्या शत्रुः)

රුමත් බිරිඳ ද සැතිරියකි.

पुत्रः शत्रुः+अपण्डितः (अपण्डितः पुत्रः शत्रुः)

නූගත් පුතා ද සතුරෙකි.

५ अनभ्यासे विषं विद्या (अनभ्यासे विद्या विषम्)

අභ්‍යාස නොකිරීමෙන් ශාස්ත්‍රය විෂ වේ.

अजीर्णे भोजनं विषम्

නොදිරවූ කල්හි ආහාරය විෂ වේ.

विषं सभा दरिद्रस्य (दरिद्रस्य सभा विषं)

දිළින්දාට සභාව විෂ ය.

वृद्धस्य तरूणी विषम्

මහල්ලාට තරුණිය විෂ වේ.

දුරවබෝධ පද

शौर्ये - ශූර බවෙහි **प्रथितं** - යෙදෙයි **उच्चार** - අශුචි **तमः** - අඳුර **अर्थागमो** - ධන සම්පත්තීන්හි පැමිණීම **वश्यः** - කීකරු **अर्थकरी** - ධන සම්පත් උපදවන **ऋणकर्ता** - ණයකාරයා **व्यभिचारिणी** - කුලසීමාවන් ඉක්මවන්නී **अजीर्णे** - නො දිර වූ කල්හි

पञ्चमः पाठः

यत्ने कृते यदि न सिश्यति कोऽत्र दोषः।

आहार निद्रा भय मैथुनं च सामान्यमेतत्पशुभिर्नराणाम्।
धर्मो हि तेषामधिको विशेषो धर्मेण हीनाः पशुभिः समानाः ॥१॥

धर्मार्थकाममोक्षाणां यस्यैकोऽपि न विद्यते।
अजागलस्तनस्येव तस्य जन्म निरर्थकम्॥२॥

यदभावि न तद्भावि भावि चेन्न तदन्यथा।
इति चिन्ताविषघ्नोऽयमगदः किं न पीयते? ॥३॥

न दैवमपि सञ्चिन्त्य त्यजेदुद्योगमात्मनः।
अनुद्योगेन कस्तैलं तिलेभ्यः प्राप्तुमर्हति? ॥४॥

उद्योगिनं पुरुषसिंहमुपैति लक्ष्मी 'दैवेन देय'मिति कापुरुषा वदन्ति।
दैवं निहत्य कुरु पौरुषमात्मशक्त्या, यत्ने कृते यदि न सिध्यति कोऽत्र दोषः? ॥५॥

අර්ථ පරිවර්තනය

१ **आहार निद्रा भय मैथुनं च**

ආහාර, නින්ද, බිය [හා] මෛථුන සේවනය ද [යන]

सामान्यम्+एतत् पशुभिः+नराणाम्](एतत् नराणाम् पशुभिः सामान्यम्)

මේ කරුණු මිනිසුන්ගේ සිවුපාවුන් හා එකසේ සමානය.

धर्मे हि तेषाम्+अधिकः विशेषः (तेषाम् अधिकः विशेषः धर्मे हि)

[ඒ] මිනිසුන්ගේ අධික වූ විශේෂයක් [හෝ ගුණයක්] වේද [එය] ධර්මයෙහි හැසිරීමයි.

धर्मेण हीनाः पशुभिः समानाः

ධර්මයෙන් තොර වූවහු සිවුපාවුන් හා සමාන වෙත්.

२ धर्म+अर्थ काम मोक्षाणां

ධර්මය, ධනය, කාමය, මෝක්ෂය යන කරුණු අතුරෙන්

यस्य+एकः+अपि न विद्यते

යමෙක් හට එකක් හෝ නොමැත්තේ ද

अजागलतनस्य+एव तस्य जन्म निरर्थकम्

එළුදෙනගේ ගෙළෙහි ඇති තනය මෙන් ඔහුගේ උපත ද නිරර්ථක වූවකි.

३ यत्+अभावि तत्+भावि (यत् अभावि तत् न भावि)

යමක් නොවෙයි ද එය නොවෙයි.

भावि चेत्+न तत्+अन्यथा (चेत् भावि तत् अन्यथा न)

ඉදින් [යමක්] වේද එය අන්පරිද්දකින් නොවේ.

इति चिन्ता विष +अघ्नः+अयम्+अगदः किं न पीयते -

මේ අයුරින් සලකන්නේ [නම්] විෂ නසන්නා වූ මෙම බෙහෙත කුමක් නිසා පානය නොකරන්නේද?

४ दैवम्+अपि सञ्चिन्त्य

දෛවය [පෙර කර්‍ම] යැයි සලකා

त्यजेत्+उद्योगम्+आत्मनः (आत्मनः उद्योगं न त्यजेत्)

තමාගේ උත්සහය අත් නොහරින්නේ ය.

न+उद्योगेन कः+तैलं प्राप्तुम्+अर्हति (न उद्योगेन तिलेभ्यः तैलं प्राप्तुं कः अर्हति)

උත්සහයෙන් තොරව තලවලින් තෙල් ලබන්නට කවරෙක්ට හැකි වේද?
[නොහැකි වේ ම ය.]

५ पुरुषसिंहम्+उप+एति (लक्ष्मी उद्योगिनं पुरुषसिंहम् उप एति)

ශ්‍රියාකාන්තාව උත්සහවන්ත පුරුෂ ශ්‍රේෂ්ඨයා වෙත එළඹේ.

देयम्+इति (दैवेन देयम् इति कापुरुषाः वदन्ति)

දෛවයෙන් ලැබ දෙන්නේ යැයි නින්දිත පුද්ගලයෝ පවසති.

पौरुषम्+अत्मशक्त्या (दैवं निहत्य आत्मशक्त्या पौरुषं कुरु)

දෛවය හැරදමා ආත්ම ශක්තියෙන් [හැකියාව ඇති පරිද්දෙන්] පුරුෂ වීර්‍ය්‍යය කරව.

कः+अत्र (यदि यत्ने कृते न सिध्यति अत्र कः दोषः)

ඉදින් උත්සාහ කළ කල්හිත් සිදු නොවෙයි [නම්] මෙහි කවර දොෂයක්ද?

දුරවබෝධ පද

विद्यते – පවතින්නේ ද **अजागलतनस्येव** – එළුදෙනගේ ගෙලෙහි තනය මෙන් **अभावि** –නොවෙයි ද **विषघ्नो** – විෂ නසන **सञ्चिन्त्य** – සලකා **अनुद्योगेन** – උත්සහයෙන් තොර ව **पुरुषसिंहं** – පුරුෂ සිංහයා වෙත **उपैति** – එළඹේ. **कापुरुषा** – පහත් පුරුෂයෝ **निहत्य** – හැරදමා

षष्ठः पाठः

अहो अद्य महद्भोज्यं मे समुपस्थितम्।

अस्ति कल्याणकटकवास्तव्यो भैरवो नाम व्याधः। स चैकदा मृगमन्विष्यन्विन्ध्याटवीं गतः। तेन तत्र व्यापादितः मृगमादाय गच्छता घोराकृतिः शूकरो दृष्तः। ततस्तेन व्याधेन मृगं भूमौ निधाय शूकरः शरेणाहतः। शूकरेणापि घनघोरगर्जनं कृत्वा स व्याधो मुष्कदेशे हतः सन् छिन्नद्रुम इव भूमौ निपपात।

अथ तयोः पादास्फलनेन सर्पोऽपि मृतः। अत्रान्तरे दीर्घरावो नाम जम्बूकः परिभ्रमन्नाहारार्थी तान्मृतान् मृगव्याधसर्पशूकरानपश्यत्। अचिन्तयच्च- अहो अद्य महद्भोज्यं मे समुपस्थितम्। एषां मांसैर्मसत्रयं मे सुखेन गमिष्यति। ततः प्रथमबुभुक्षियामिदं निःस्वादु कोदण्डलग्नं स्नायुबन्धनं खादामि। इत्युक्त्वा तथाऽकरोत्। ततश्छिन्ने स्नायुबन्धने उत्पतितेन धनुषा हृदि निर्भिन्नः स धीर्घरावः पञ्चत्वं गतः।

ඔහෝ මට අද ලොකු කෑමක් හම්බ උණා.

කල්‍යාණකටක නම් ස්ථානයෙහි වසන්නා වූ භෛරව නම් වැද්දෙක් විය. ඒ වැද්දා එක් දිනක් සතෙකු සොයන්නේ වින්ධ්‍යා නම් වනයට ගියේ ය. එහි දී ඒ වැද්දා විසින් එක් මුවෙක් මරන ලදී. මුවා ගෙන මුවා රැගෙන යන්නා වූ ඔහු දරුණු ස්වභාව ඇති ඌරෙක් දක්නා ලදී. අනතුරු ව මුවා බිම තබා ඒ වැද්දා විසින් ඊයෙන් ඌරා නසන ලද්දේ ය. ඌරා විසින් ද මේඝගර්ජනාව බඳු බියකරු වූ ගර්ජනාවක් කොට ඒ වැද්දාගේ වෘෂණකෝෂ ප්‍රදේශයෙහි නසන ලද්දේ සිඳින දල ගසක් මෙන් (ඔහු) බිම වැටුණි.

ඉක්බිති ඒ ඌරු වැදි දෙදෙනාගේ පා ගැටීමෙන් සර්පයෙක් ද මළේ ය. මේ අතරෙහි දීර්ඝරාව නම් සිවලෙක් ආහාර සොයමින් හැසිරෙන්නේ මැරුණු ඒ මුව වැදි සර්ප හා ඌරු යන මොවුන් දුටුවේ ය. මෙසේ ද සිතුවේය. අනේ (වාසනාවන්) අද මහත් ආහාරයක් මා වෙත එළෙඹ සිටියේ ය. මොවුන්ගේ මස්වලින් තුන් මාසයක් මට සැප සේ කල් යැවිය හැකි වන්නේ ය. එබැවින් පළමු ව බඩගින්නෙහි රසයෙන් තොර වූ මෙම දුන්නේ කෙළවර එල්බෙන වරපට කමි. මෙසේ කියා එසේ කළේ ය. ඉක්බිති වරපට සිඳුනු කල්හි නැංගා වූ දුන්නෙන් බිඳී ගිය හදවත ඇති ඒ දීර්ඝරාව නම් සිවලා මරණයට පත් වූයේ ය.

දුරවබෝධ පද

वास्तव्यः - වාසය කරන **व्यापादितः** - නසන ලදී. **घोराकृतिः** - බිහිසුණු පෙනුමක් ඇති **निधाय** - තබා **शरेणाहतः** - ඊයෙන් මරණ ලදී. **घनघोरगर्जनं** - දරුණු ගෙරවීම **मुष्कदेशे** - අණ්ඩකෝෂ ප්‍රදේශයෙහි **छिन्नद्रुम** - සිඳ හෙලූ ගස **पादास्फलनेन** - පා මැඩීමෙන් **समुपस्थितम्** - එළඹුණේ විය. **कोदण्डलग्नं** - දුන්නේ අග බඳින ලද **स्नायुबन्धनं** - නහරවැලින් බඳනා ලද **धनुषा** - දුන්නෙන් **हृदि** - පපුවෙහි **भिन्नः** - බිඳුනේ **पञ्चत्वं गतः** - මරණයට පත්විය.

सप्तमः पाठः

यथा ह्येकेन चक्रेण न रथस्य गतिर्भवेत्।

यथा ह्येकेन चक्रेण न रथस्य गतिर्भवेत्।
एवं पुरुषकारेण विना दैवं न सिध्यति ॥१॥

पूर्वजन्मकृतं कर्म तद्दैवमिति कथ्यते।
तस्मात्पुरुषकारेण यत्नं कुर्यादतन्द्रितः ॥२॥

काकतालीयवत् प्राप्तं दृष्ट्वापि निधिमग्रतः।
न स्वयं दैवमादत्ते पुरुषार्थमपेक्षते ॥३॥

उद्यमेन हि सिद्यन्ति कार्याणि न मनोरथैः।
न हि सुप्तस्य सिंहस्य प्रविशन्ति मुखे मृगाः ॥४॥

मातृपितृकृतभ्यासो गुणितामेति बालकः।
न गर्भच्युतिमात्रेण पुत्रो भवति पण्डितः ॥५॥

අර්ථ පරිවර්තනය

එක් රෝදයකින් රථයේ ගමනක් නොමැත්තේ ය.

१ हि+एकेन गतिः+भवेत् (यथा हि एकेन चक्रेण रथस्य गतिः न भवेत्)

යම්සේ වනාහි එක් රෝදයකින් රථයේ ගමනක් නොවේම ය.

एवं पुरुषकारेण विना दैवं न सिध्यति -

එසේ [ම] පුරුෂෝත්සාහයයෙන් තොරව භාග්‍ය [වාසනාව] සිදු නොවේ.

२ तत्+दैवम्+इति (पूर्वजन्मकृतं कर्म तत् दैवम् इति कथ्यते)

පෙර භවයේදී කරන ලද [යම්කිසි] කර්මයක් [වේද] එය දෛවය යැයි කියනු ලැබේ.

कुर्यात्+अतन्द्रितः (तस्मात् अतन्द्रितः पुरुषकारेण यत्नं कुर्यात्)

එබැවින් කම්මැලි නොවී පුරුෂ උත්සහයෙන් ප්‍රයත්න කරන්නේ ය.

३ दृष्ट्वा+अपि / निधिम्+अग्रतः (काकतालीयवत् प्राप्तं निधिम् अग्रतः दृष्ट्वा अपि)

ඉබේ ම පැමිණියාවූ නිධානයක් ඉදිරියෙහි දැක වුවත්.

दैवम्+अदत्ते / पुरुषार्थम्+अपेक्षते (दैवम् स्वयं न आदत्ते पुरुषार्थम् अपेक्षते)

දෛවය තාමා ම [එය] නොගන්නේ ය. පුරුෂවීර්‍යය් බලාපොරොත්තු වන්නේ ය.

४ उद्यमेन हि सिद्यन्ति कार्याणि न मनोरथैः (कार्याणि उद्यमेन हि सिद्यन्ति न मनोरथैः)

[සියලු] කටයුතු උත්සහයෙන් ම සිදු වේ බලාපොරොත්තු පමණින් සිදු නොවේ.

न हि सुप्तस्य सिंहस्य प्रविशन्ति मुखे मृगाः (सुप्तस्य सिंहस्य मुखे मृगाः न हि प्रविशन्ति)

නිදිගත් සිංහයාගේ මුවෙහි සිවුපාවෝ නොපිවිසෙත්.

५ कृत+अभ्यासः / गुणिताम्+एति (बालकः मातृ पितृ कृत अभ्यासः गुणिताम् एति)

දරුවා මව්පියන් විසින් කරණ ලද පුරුදු පුහුණු [ඉගැන්වීම්] තුළින් ගුණවත් බවට [හෙවත් පණ්ඩිත බවට] පැමිණේ.

न गर्भच्युतिमात्रेण पुत्रो भवति पण्डितः (गर्भच्युतिमात्रेण पुत्रः पण्डितः न भवति) මව් ගැබෙන් නික්මූ පමණකින් ම දරුවා පණ්ඩිතයෙක් නොවේ.

<u>දුරවබෝධ පද</u>

अतन्द्रितः - අලස නොවී **काकतालीयवत्** - අනපේක්ෂිත ව/ ඉබේ **प्राप्तं** - පැමිණි **निधिं +अग्रतः** - නිධානයක් ඉදිරියෙහි **मनोरथैः** - බලාපොරොත්තුවලින් **मृगाः** - සිවුපාවෝ **गर्भच्युतिमात्रेण** - මව්කුසින් නික්මූ පමණකින් ම/හැටියේ ම